සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

51 | S | I

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018


**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය ................................ චිත්‍ර I කාලය පැය තුනයි

| | | |
|---|---|---|
| උපදෙස් | - | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. |
| 1 කොටස | - | ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.<br>එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න. |
| 11 කොටස | - | අනු කොටස් තුනකින් සමන්විතය.<br>එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන, ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.<br>1 කොටස හා 11 කොටසට අදාල පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න. |

## I කොටස

◆ **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් A, B, C, D, E යන ඡායාරූප ඇසුරින් තෝරන්න.**


A


B


C


D


E

01. A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
   1. ග්‍රීක වාස්තු විද්‍යාවට අයත් ඩොරික් කුළුණකි.
   2. ග්‍රීක වාස්තු විද්‍යාවට අයත් අයොනික් කුළුණකි.
   3. මිසර පාතිනන් දේවස්ථානයේ කුළුණකි.
   4. රෝම වාස්තු විද්‍යාවට අයත් විජයග්‍රහණ කුළුණකි.
   5. ග්‍රීක වාස්තු විද්‍යාවට අයත් කොරින්තියන් කුළුණකි. (.......)

02. B අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය,
   1. යාපහුව රජ මැදුරේ දක්නට ඇති කැටයමකි.
   2. යාපහුව පඩි පෙළෙහි දක්නට ඇති කැටයමකි.
   3. ගඩලාදෙණිය රජ මාළිගයේ දක්නට ඇති කැටයමකි.
   4. ගඩලාදෙණිය පඩි පෙළෙහි දක්නට ඇති කැටයමකි.
   5. පොළොන්නරුව වටදාගෙයි දක්නට ඇති කැටයමකි. (.......)

03. C අක්ෂරයෙන් දැක්වෙන කැටයමෙන්,
1. ගුප්ත කලා ලක්ෂණ පිළිබිඹු වේ.
2. පල්ලව කලා ලක්ෂණ පිළිබිඹු වේ.
3. ගාන්ධාර කලා ලක්ෂණ පිළිබිඹු වේ.
4. අමරාවතී කලා ලක්ෂණ පිළිබිඹු වේ.
5. භාරතීය කලා ලක්ෂණ පිළිබිඹු වේ. (.......)

04. D අක්ෂරයෙන් දැක්වෙන්න නිර්මාණය,
1. භාරුත් කැටයම් අතර දැකිය හැක.
2. ගාන්ධාර කැටයම් අතර දැකිය හැක.
3. අමරාවතී කැටයම් අතර දැකිය හැක.
4. සාංචි කැටයම් අතර දැකිය හැක.
5. එල්ලෝරා කැටයම් අතර දැකිය හැක. (.......)

05. E අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1. කළුගල් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
2. හුණුගල් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
3. දැව මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
4. ලෝකඩ මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි.
5. මිශ්‍ර මාධ්‍යයෙන් කරන ලද නිර්මාණයකි. (.......)

◆ **අංක 6 සිට 10 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

06. මෝගල් අධිරාජ්‍ය සමයේ චිත්‍ර කලාවට අනුග්‍රහය ලබා නොදුන්නේ,
1. අක්බර් රජුය. 2. අවුරංගශෙබ් රජුය. 3. ජෙහන්ගීර් රජුය.
4. හුමායන් රජුය. 5. සාජහන් රජුය. (.......)

07. භාරතයේ කැටයම් තුළින් සංකීර්ණ හා භාවාත්මක ප්‍රකාශන ඉදිරිපත් කළේ,
1. මථුරා ශිල්පීන් ය. 2. සුංග ශිල්පීන් ය. 3. මෞර්ය ශිල්පීන් ය.
4. ගන්ධාර ශිල්පීන් ය. 5. අමරාවතී ශිල්පීන් ය. (.......)

08. ගඩලාදෙණි විහාරයේ බාහිර පෙනුම සාමාන්‍ය බෞද්ධ විහාරයකින් වෙනස් වන්නේ,
1. හින්දු ගෘහ නිර්මාණ ලක්ෂණ දක්නට ඇති බැවිනි.
2. සම්පූර්ණයෙන් ම කළු ගලින් නිමකර ඇති බැවිනි.
3. විහාරය මත පිහිටා ඇති අටපැති ශිඛරය නිසාවෙනි.
4. හින්දු ආගමික සංකල්පය අනුව ගොඩ නංවා ඇති හෙයිනි.
5. දකුණු ඉන්දීය ශිල්පියෙකුගේ නිර්මාණයක් වන හෙයිනි. (.......)

09. මේස රෙද්දකට, කුෂන් කවරයකට වඩාත් උචිත වන්නේ,
1. ඇප්ලික් ක්‍රමයට නිමකළ හැකි සැරසිලි මෝස්තරයකි.
2. වඩා පහසුවෙන් මුද්‍රණය කළ හැකි සැරසිලි මෝසතරයකි.
3. සිරස් තීරු සහිත වර්ණ කීපයකින් යුතු මෝස්තරයකි.
4. ව්‍යුක්ත හැඩතල සහිත ව්‍යාප්ත මෝස්තරයකි.
5. නිශ්චිත හැඩ හෝ හැඩයක් තුළ නිර්මාණය වන මුළු තල මෝස්තරයකි. (.......)

10. පිටපත් වැඩි සංඛ්‍යාවක් ලබා ගැනීමට අවශ්‍ය වූ විටක
1. ඕෆ්සෙට් මුද්‍රණ ක්‍රමය යොදා ගත හැක.
2. ඩිජිටල් මුද්‍රණ ක්‍රමය යොදාගත හැක.
3. අච්චු මුද්‍රණ ක්‍රමය යොදාගත හැක.
4. පරිගනක මුද්‍රණ ක්‍රමය යොදා ගත හැක.
5. තිර (ස්ක්‍රීන්) මුද්‍රණ ක්‍රමය යොදා ගත හැක. (.......)

◆ අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත 1 සිට 8 දක්වා ඇති රූප ඇසුරු කරගෙන තෝරන්න.



1 2 3 4 5 6 7 8

11. ඉහත නිර්මාණ අතරින් කිරි ගරුඩ මාධ්‍යයෙන් නිම කළ කෘතීන් කුමක්ද?
1. 3,6 2. 4,6 3. 6,8 4. 2,3 5. 2,4 (.......)

12. ආගමික බලපෑම ඍජු ලෙස සිදු වූ මූර්ති මොනවාද?
1. 3,5 2. 2,7 3. 4,6 4. 1,8 5. 2,5 (.......)

13. බලය අරමුණු කරගෙන ඉදි වූ නිර්මාණ මොනවාද?
1. 1,2,5 2. 3,4,5 3. 5,6,7 4. 6,7,8 5. 4,5,8 (.......)

14. දේව සංකල්පය මත ගොඩ නගන ලද නිර්මාණ මොනවාද?
1. 1,3 2. 4,6 3. 3,5 4. 1,8 5. 1,7 (.......)

15. මෙම නිර්මාණ අතරින් පැරණිම නිර්මාණ දෙක මොනවාද?
1. 2,7 2. 4,7 3. 5,8 4. 6,8 5. 3,6 (.......)

◆ ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

16. අමූර්තවාදී කලා ලක්ෂණයෙන් යුත් මානව රූප සහිත බිතු කැටයමක සාර්ථකත්වය රැඳී ඇත්තේ,
1. මානව රූප වල ජීව පරිමාණ හා හැඩ වෙනස් කිරීම තුළය.
2. මානව රූප යථා රූපීව යෙදීම තුළය.
3. මානව රූප වියුක්ත රූපීව යෙදීම තුළය.
4. මානව රූප විකෘති කර යෙදීම තුළය.
5. මානව රූපය තාත්විකව යෙදීම තුළය. (.......)

17. 'තියඩෝරා රැජින සහ සේවිකාවෝ' නම් බයිසන්තියානු කලාවට අයත් සිතුවම,
1. සැන්විටාලේ දේවස්ථානය තුළ දක්නට ඇත.
2. හේ ගියා සොෆියා දේවස්ථානය තුළ දක්නට ඇත.
3. නෝට්‍රේ ඩැම් දේවස්ථානය තුළ දක්නට ඇත.
4. චාට්‍රස් දේවස්ථානය තුළ දක්නට ඇත.
5. සෙන්ට් කැතරින් දේවස්ථානය තුළ දක්නට ඇත. (.......)

18. රංජිත වීදුරු කැබලි ගලපා කරන ලද නිර්මාණ දක්නට ඇත්තේ,
1. හින්දු ක්‍රමයේ දේවස්ථාන වලය.
2. ගොතික් ක්‍රමයේ දෙවස්ථාන වලය.
3. බයිසැන්තියන් දේවස්ථාන වලය.
4. ග්‍රීක දේවස්ථාන වලය.
5. මිසර දේවස්ථාන වලය. (.......)

19. ලියනාඩෝ ඩාවින්ගේ පර්වත මස්තකයේ දේව මෑණියෝ චිත්‍රයෙන්,
1. හැඟීම් සමුදායක් මැනවින් ප්‍රකාශ වේ.
2. දැඩි බව සහ අධිෂ්ඨානශීලි බව මැනවින් ප්‍රකාශ වේ.
3. කල්පනාකාරී බව සහ අධිෂ්ඨානශීලි බව මැනවින් ප්‍රකාශ වේ.
4. කරුණාව, දයාව සහ මාතෘත්වය මැනවින් ප්‍රකාශ වේ.
5. සිතෙහි ඒකාග්‍රතාවය සහ කරුණාව මැනවින් ප්‍රකාශ වේ. (.......)


20. ශ්‍රී ලංකාව හා සම්බන්ධ බෞද්ධ ඉතිහාස සිදුවීම් චිත්‍රයට නැගූ ශිල්පියකු ලෙස,
1. එම්.සාර්ලිස් මහතා හැඳින්විය හැක.
2. සෝමබන්දු විද්‍යාපති මහතා හැඳින්විය හැක.
3. එල්.ටී.පී. මංජු ශ්‍රී මහතා හැඳින්විය හැක.
4. හෙන්රි ධර්මසේන මහතා හැඳින්විය හැක.
5. සෝලියස් මැන්දියස් මහතා හැඳින්විය හැක. (.......)

◆ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වලට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් නිවැරදි පිළිතුර තෝරන්න.**

21. ඉදිරියෙන් දැක්වෙන්නේ,
1. දඹදිව බුද්ධගයා විහාරයයි.
2. වැල්ලේ දේවාලයයි.
3. පංච පාණ්ඩව රථ දේවාලයයි.
4. තන්ජෝරයේ රාජ රාජේශ්වර දේවාලයයි.
5. මහා බලිපුරම්හි රාත් දොවොලයි. (.......)



22. මෙහි දැක්වෙන වාස්තු විද්‍යාත්මක නිර්මාණය,
1. ප්‍රතිමා රැසක් සහිත දෙවොලකි.
2. නයිල් නිම්නයෙහි ඇති දෙවොලකි.
3. දැව භාවිතයෙන් ඉදිකළ දෙවොලකි.
4. ගොඩ නගන ලද දෙවොලකි.
5. පර්වතය හාරා ඉදිකරන ලද දෙවොලකි. (.......)




23. ඉදිරියෙන් දැක්වෙන ගොඩනැගිල්ලේ අභ්‍යන්තරයේ,
1. දරුවාට කිරි දෙන මව නැමති කැටයම දැකිය හැක.
2. විදේශීය සේවායා නැමති කැටයම දැකිය හැක.
3. නයි පොරය නැමති කැටයම දැකිය හැක.
4. බිනර මල නැමති කැටයම දැකිය හැක.
5. ලණු ගැටය නැමති කැටයම දැකිය හැක. (.......)



24. මෙම පොකුණ භාවිතා කර ඇත්තේ,
1. රජවරුන්ගේ පැන් පහසුව සඳහා ය.
2. ස්වාමීණ් වහන්සේලාගේ පැන් පහසුව සඳහා ය.
3. කුමාරවරුනගේ පැන් පහසුව සඳහා ය.
4. තවුසන්ගේ පැන් පහසුව සඳහා ය.
5. ප්‍රභූවරුන්ගේ පැන් පහසුව සඳහා ය. (.......)



25. ඉදිරියෙන් දැක්වෙන දේවස්ථානය,
1. බයිසැන්තියන් කලාවට අනුව නිර්මාණය කර ඇත.
2. ගොතික් කලා සම්ප්‍රදායට අනුව ඉදිකර ඇත.
3. මොසෙක් කලාවට අනුව ඉදිකර ඇත.
4. මෝගල් කලා සම්ප්‍රදායට අනුව ඉදිකර ඇත.
5. පල්ලව කලා සම්ප්‍රදායට අනුව ඉදිකර ඇත. (.......)




◆ **අංක 26 සිට 30 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F, G, H, I, J ලෙස නම්කර ඇති මූර්ති ඇසුරෙන් තෝරන්න.**



F



G



H



I



J

26. F අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය දක්නට ලැබෙන්නේ,
1. වාහල්කඩ කැටයම් අතරය.
2. පඩිපෙළ අසල කැටයම් අතරය.
3. දාගැබ අවට කැටයම් අතරය.
4. පොකුණ අසල කැටයම් අතරය.
5. උපෝසථ ඝර අසල කැටයම් අතරය. (.......)

27. G අක්ෂරයෙන් දැක්වෙන අම්පිටිය සෙමනේරියේ ඇති මූර්තිය,
1. කොළඹ යුගයට අයත් ජස්ටින් දැරණියගල මහතාගේ නිර්මාණයකි.
2. කොළඹ යුගයට අයත් හැරී පීරිස් මහතාගේ නිර්මාණයකි.
3. කොළඹ යුගයට අයත් අයිවන් පීරිස් මහතාගේ නිර්මාණයකි.
4. කොළඹ යුගයට අයත් රිචඩ් ගේබ්‍රියල් මහතාගේ නිර්මාණයකි.
5. කොළඹ යුගයට අයත් තිස්ස රණසිංහ මහතාගේ නිර්මාණයකි. (.......)


28. H අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණය,
1. හෙන්රි මුවර් වියුක්ත හැඩතල ඇසුරින් කළ උද්‍යාන මූර්තියකි.
2. හෙන්රි මුවර් මව සහ දරුවා නමින් කළ නව නිර්මාණයකි.
3. ඔගස්තේ රොඩින් මව සහ දරුවා නමින් කළ නව නිර්මාණයකි.
4. මව සහ දරුවා ලෙස නම් කළ අමූර්තවාදී නිර්මාණයකි.
5. ජෝන් මීරෝ මව සහ දරුවා නමින් කළ නව නිර්මාණයකි. (.......)

29. I අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණ විශේෂය සඳහා පාදක වූයේ,
1. හින්දු ආගමික සංකල්පයන් ය.
2. ඉස්ලාම් ආගමික සංකල්පයන් ය.
3. බෞද්ධ ආගමික සංකල්පයන් ය.
4. කතෝලික ආගමික සංකල්පයන් ය.
5. ක්‍රිස්තියානි ආගමික සංකල්පයන් ය. (.......)

30. J අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය සඳහා,
1. හින්දු දේව මූර්ති වල ලක්ෂණ මුලාශ්‍ර කොටගෙන ඇත.
2. ඉස්ලාම් දේව මූර්ති වල ලක්ෂණ කොටගෙන ඇත.
3. බටහිර දේව මූර්ති වල ලක්ෂණ මුලාශ්‍ර කොටගෙන ඇත.
4. මිසර මූර්ති වල ලක්ෂණ මුලාශ්‍ර කොටගෙන ඇත.
5. ඉන්දු නිම්න මූර්ති වල ලක්ෂණ මුලාශ්‍ර කොටගෙන ඇත. (.......)

◆ **අංක 31 සිට 35 දක්වා අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර K, L, M, N, O ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.**




K L M N O

31. K අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
1. අබනීන්ද්‍රනාත් තාගෝර්ගේ දැරිය නැමති නිර්මාණය ය.
2. අම්රිතාශර්ගිල්ගේ යුවතිය නැමති නිර්මාණය ය.
3. රබීන්ද්‍රනාත් තාගෝර්ගේ කාන්තාව නැමති නිර්මාණ ය.
4. නන්දලාල් බෝස්ගේ රාධාගේ විරහව නැමති නිර්මාණ ය.
5. ජෙමිනි රෝයිගේ යුවතිය නැමති නිර්මාණ ය. (.......)

32. L අක්ෂරයෙන් දැක්වෙන නිර්මාණ ය,
1. නර්තනය පිළිබඳ සිතන බව අරමුණු කරගෙන නිර්මාණය වී ඇත.
2. අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනය අරමුණු කරගෙන නිර්මාණය වී ඇත.
3. තාලය ගැන අවධානයෙන් සිටීම අරමුණු කරගෙන නිර්මාණය වී ඇත.
4. නර්තන කණ්ඩායම ගැන අවධානයෙන් සිටීම අරමුණු කරගෙන නිර්මාණය වී ඇත.
5. බාහිර හැඩය ගැන අවධානයෙන් සිටීම අරමුණු කරගෙන නිර්මාණය වී ඇත. (.......)

33. M අක්ෂරයෙන් දැක්වෙන්නේ කතළුව පූර්වාරාම විහාරයේ,
1. පටාචාර කතා වස්තුවේ අවස්ථාවකි.
2. චුල්ල ධර්මපාල ජාතකයේ අවස්ථාවකි.
3. තේමිය ජාතකයේ අවස්ථාවකි.
4. සුත සෝම ජාතකයේ අවස්ථාවකි.
5. වෙස්සන්තර ජාතකයේ අවස්ථාවකි. (.......)

34. N අක්ෂරයෙන් ඉදිරිපත් කර ඇති සිතුවම,
1. අමූර්තවාදීකලා සම්ප්‍රදායේ නියමුවෙකු විසින් අඳින ලද්දකි.
2. උපස්ථිති කලා සම්ප්‍රදායේ නියමුවෙකු විසින් අඳින ලද්දකි.
3. පශ්චාත් උපස්ථිතිවාදී කලා සම්ප්‍රදායේ නියමුවෙකු විසින් අඳින ලද්දකි.
4. අධිතාත්විකවාදීකලා සම්ප්‍රදායේ නියමුවෙකු විසින් අඳින ලද්දකි.
5. ඝනිකවාදී කලා සම්ප්‍රදායේ නියමුවෙකු විසින් අඳින ලද්දකි. (.......)

35. O අක්ෂරයෙන් දැක්වෙන්නේ අධිතාත්විකවාදී ශිල්පියෙකු වන මාක් චාගල්ගේ ,
1. අසූර්හි රත්තරන් නැමති සිතුවමයි.
2. මම සහ මගේ ගම නැමති සිතුවමයි.
3. උපන්දිනය නැමති සිතුවමයි.
4. නොමියෙන මතකය නැමති සිතුවමයි.
5. නො. 32 නැමති සිතුවමයි. (.......)

◆ **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.**



36. මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ,
1. ජේ.ඩී.ඒ. පෙරේරා ශිල්පියා විසිනි.
2. පියරේ ඔගස්තේ රෙනෝ ශිල්පියා විසිනි.
3. අම්රිතා ශර්ගිල් ශිල්පියා විසිනි
4. හැරී පීරිස් ශිලිපියා විසිනි.
5. ජෙමිනි රෝයි ශිල්පියා විසිනි (.......)

37. මෙම සිතුවමින්,
1. ඉන්දියානු ආගමික ජීවිතය විග්‍රහ කෙරේ
2. ඉන්දියානු ජන ජීවිතය විග්‍රහ කෙරේ.
3. ඉන්දියානු ජාතිකත්වය විග්‍රහ කෙරේ.
4. ඉන්දියානු ජනතාවගේ ඇඳුම් නිර්මාණ ගැන විග්‍රහ කෙරේ.
5. ඉන්දියානු කාන්තාවගේ ලාලිත්‍ය විග්‍රහ කෙරේ. (.......)

38. මෙම සිතුවමෙහි වර්ණ භාවිතයේ විශේෂත්වය වන්නේ,
1. වර්ණ පදාස ලෙස යෙදීමයි.
2. සංගත වර්ණ යොදා තිබීමයි.
3. සීමිත වර්ණ කීපයක් සංයමයකින් යොදා තිබීමයි.
4. වේගවත් පින්සල් පහරවලින් වර්ණ යොදා තිබීමයි.
5. ආලෝකය හා අඳුර මතුවන සේ වර්ණ යොදා තිබීමයි. (.......)

39. මෙහි මානව රුව හසුරුවා ඇත්තේ,
1. කාන්තා ලක්ෂණ ඉස්මතු වන ආකාරයට ය.
2. රූපයේ සවිස්තරාත්මක බව දැක්වෙන ආකාරයටය.
3. සංරචනයේදී පරිසරය වැඩි ඉඩක් ලැබෙන ආකාරයට ය.
4. බාහිර ස්වරූපයට වඩා භාවයන් ප්‍රකාශ වන ආකාරයට ය.
5. හිස් අවකාශය තුළ රූප ඉස්මතු වන ආකාරයට ය. (.......)

40. මෙම සිතුවම ඇඳි ශිල්පියාගේ නිර්මාණ සඳහා,
1. මෝගල්, රාජ්පුට්, පහාරි, චිත්‍ර කලාවන්ගේ ආභාෂය ලැබී ඇත.
2. මෝගල්, රාජ්පුට්, මිසර චිත්‍ර කලාවන්ගේ ආභාෂය ලැබී ඇත.
3. රාජ්පුට්, පහාරි, සීගිරි චිත්‍ර කලාවන්ගේ ආභාෂය ලැබී ඇත.
4. රාජ්පුට්, පහාරි, මහනුවර චිත්‍ර කලාවන්ගේ ආභාෂය ලැබී ඇත.
5. මෝගල්, පහාරි, ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවන්ගේ ආභාෂය ලැබී ඇත. (.......)

## **13 ශ්‍රේණිය - චිත්‍ර I**

## II කොටස

- **මෙය අනු කොටස් තුනකින් සමන්විතය.**
- **එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**
  **(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)**

### 'අ' කොටස

### **සංස්කෘතික පසුබිම හා රසාස්වාදය**

### **ශ්‍රී ලංකාව**

01. මහින්දාගමනයෙන් පසුව දෛනික අවශ්‍යතා සහ ආරක්ෂාව සඳහා ගෘහ නිර්මාණ අංග කීපයක් නිර්මානය විය.
   i. ආරක්ෂාව සඳහා ඉදිවූ ගෘහ නිර්මාණ අංග දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)
   ii. ස්ථූපය සඳහා ඉදිවූ ගෘහ නිර්මාණ අංගය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   iii. උප අංගයක් ලෙස එකතු වූ වාහල්කඩ නිර්මාණය පිළිබඳ විස්තරාත්මක ඇගයීමක යෙදෙන්න. (ලකුණු 10 යි)

02. මහනුවර සමයේ බෞද්ධ සිද්ධාස්ථාන ආශ්‍රිතව බිහි වුයේ අක්ෂි ගෝචර චිත්‍ර කලාවකි. එම සිතුවම් වල ශේෂයන් අද ද බොහෝ විහාරස්ථාන වල දැකිය හැක.
   i. එම යුගයට අයත් දෙගල්දොරුව විහාරයේ ඇති සිතුවම් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)
   ii. ඉන් එකක් වන ඇලි ඇතුන් දන්දීම සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   iii. දඹුලු විහාරය තුළ මහනුවර සම්ප්‍රදායට අයත් නිර්මාණ රැසක් දැකිය හැක. එහි ඇති සිතුවම් පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10 යි)

### 'ආ' කොටස

### **සංස්කෘතික පසුබිම හා රසාස්වාදය**

### **ඉන්දියාව**

03. ආගමික දර්ශනයෙන් බැහැරව ලෞකික තේමාවන් ඔස්සේ චිත්‍ර නිර්මාණය කිරීම මෝගල්වරුන් විසින් කරන ලදී.
   i. චිත්‍ර කලාව සඳහා අනුග්‍රහය ලබාදුන් මෝගල් රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04 යි)
   ii. මෝගල් චිත්‍රයක් වන ''ලේනුන්ගෙන් පිරි හේනේගස'' නැමති නිර්මාණය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   iii. මෝගල් හා රාජ්පුට් චිත්‍ර කලා සම්ප්‍රදායන් දෙක පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 10 යි)

04. ක්‍රි.පූ. 3000 ත් 1500 ත් අතර කාලයට අයත් මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ඨාචාරය විවිධ මානව වර්ග වලින් සමන්විත වූ බවත්, නගර හැටකට අධික සංඛ්‍යාවකින් යුක්ත වූ බවත් පුරා විද්‍යාඥයින්ගෙන් අදහසයි.
   i. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ මුද්‍රා දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)
   ii. මෙම ශිෂ්ටාචාරයෙන් හමු වූ පූජක රුව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ සවිස්තර ඇගයීමක් කරන්න.(ලකුණු 10 යි)

## 'ඉ' කොටස

## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය

### යුරෝපය

05. ග්‍රීක මූර්ති කලාවේ මූලාදර්ශනයන් මත පිහිටමින් බිහි වූ රෝම මූර්ති කලාව මගින් විශිෂ්ඨ නිර්මාණ රැසක් ලොවට දායාද කරන ලදී.

    i. රෝම උඩුකය මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)

    ii. රෝම නිර්මාණයක් වන ඔගස්ටස් සීසර්ගේ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

    iii. රෝම ගෘහ නිර්මාණ කලාවට අයත් කොලෝසියම් රංග පීඨය විජයග්‍රහණ ආරුක්කු සහ කුළුණු පිළිබඳ විස්තරාත්මක ඇගයීමක යෙදෙන්න. (ලකුණු 10 යි)

06. ක්‍රි.පූ. 5000 ට වඩා පැරණි මිසර ශිෂ්ඨාචාරය විශ්මිත කලාකෘති වලට උරුමකම් කියයි.

    i. මිසර මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)

    ii. විශිෂ්ඨ ගෘහ නිර්මාණ අංගයක් වන සිම්බල් දේවස්ථානය පිළිබඳ කෙටියනේ හඳුන්වන්න.(ලකුණු 06 යි)

    iii. මිසරයේ මධ්‍යම රාජධානි යුගයේ නිර්මාණය වූ කුරුළු දඩයම චිත්‍රය පිළිබඳ විස්තරාත්මක ඇගයීමක යෙදෙන්න. (ලකුණු 10 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

| 51 | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Third Term Test - Grade 13 - 2018

විභාග අංකය .................................. **චිත්‍ර II** කාලය පැය තුනයි

<u>අයදුම්කරුවන්ට උපදෙස්</u>

- ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍රය එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකිය.

මාධ්‍යය :-

දියසායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිත කිරීමට නිදහස ඇත.

### ස්වාභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය සහිත පැලැටිය පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඇඳ වර්ණ කරන්න.
- කඩදාසි තලය, අර්ථවත්ව භාවිතා කරමින් චිත්‍රය සැලසුම් කිරීම.
- එකිනෙක ද්‍රව්‍යයන්ගේ ස්වභාවය හා පරිමාණය හොඳින් අවබෝධය කරගෙන දකින දේ ඇඳීම.
- අස්මට්ටම, පර්යාවලෝකය. සහ ත්‍රිමාණ ලක්ෂණ අවබෝධයෙන් යුතුව භාවිතා කිරීම.
- ගති ලක්ෂණ හා මතුපිට ස්වභාවය දැක්වෙන පරිදි වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රමය අර්ථවත්ව භාවිතා කරමින් ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යෙදීම.
- සමස්ථ චිත්‍රයේ නිමාව සහ ඉන් මතුවන චිත්‍රමය ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වීම.

  ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමණය ඔබගේ චිත්‍රයට නොගැළපේ නම් ගැළපෙන පරිදි වෙනස් කර ඇඳීමට ඔබට ඉඩකඩ තිබේ.

**අභිමතාර්ථ:-**

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාවය හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

**ලකුණු දීමේ නිර්ණායක:-**

01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරිමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරිමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) (ල. 20)
04. වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51 | S | III

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ..................................

# චිත්‍ර III

කාලය පැය තුනයි

උපදෙස් :-

- පහත සඳහන් 'අ' , 'ආ' සහ 'ඉ' කොටස් තුනෙන් එක් කොටසක් තෝරගන්න.
- එමකොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- ඔබේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලි ව ලියන්න.
- චිත්‍රය භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල්, කුඩු සායම් යන මාධ්‍ය මිශ්‍රිතව භාවිතා කිරීමට නිදහස ඇත.

## "අ" කොටස - චිත්‍ර සංරචනය

පහත සඳහන් මාතෘකාවලින් එකක් පමණක් තෝරගන්න.

01. හිරු නැගෙන මද අඳුරේ දනට වඩිනා කිරි අම්මාවරුන්
02. නොසිතූ මොහොතක ඇද හැලෙන වර්ෂාවෙන් කලබලකාරී වීදියක දර්ශනයක්
03. වැසි සමය ආරම්භයත් සමඟ ගම්මානයේ කුඹුරු යාය කඩිනමින් සීසාමින් වපුරන ගෙවියෝ, ගෙවිලියෝ

## 'ආ' - මෝස්තර නිර්මාණය

01. සාම්ප්‍රදායික සැරසිලි රටාවන් යොදා ගනිමින් උඩරට සාම්ප්‍රදායික මනාලියකගේ සාරියක් සැරසීමට ඔසරි පල්ලුවකට සුදුසු මෝස්තර නිර්මාණය කරන්න.
02. අඩි 10 x 12 ප්‍රමාණයේ සිවිලිමකට සාම්ප්‍රදායික සිංහල සැරසිලි රටා යොදා මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.
03. නාන කාමරයේ බිත්තිය සරසන මනහර රටා මවන අඩි 1 x 1½ ප්‍රමාණයේ පිඟන් ගඩොලක් සඳහා මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

## 'ඉ' ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය


01. ඉතිහාස වීර උපමා කථාවකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කර සුදුසු වර්ණ යොදන්න.
02. 'උඩරට නර්තන කලාව' නමින් මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වන පොතක පිටකවරය සැරසීමට දේශීය අනන්‍යතාවය ගොඩ නැගෙන පරිදි 21 x 15 cm ප්‍රමාණයේ කංචුකයක් අක්ෂර හා රූප සහිතව නිර්මාණය කරන්න.
03. ඔබගේ පාසලේ මාධ්‍ය ඒකකයක් ආරම්භ කිරීම සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කර වර්ණ කරන්න.

තෙවන වාර පරීක්ෂණය 2018 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන

மூன்றாம் தவணைப் பரீட்சை – 2018 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்

13 ශ්‍රේණිය – தரம் 13

**රූප සටහනේ සඳහන් පරිදි ද්‍රව්‍ය සපයා ගන්න.**
**உருவுக்கு அமைய பொருட்களை வைக்கவும்.**



## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## තෙවන වාර පරීක්ෂණය - 2018 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව I
## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 1 | 21. | 4 | 31. | 5 |
| 2. | 1 | 12. | 2 | 22. | 5 | 32. | 2 |
| 3. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 4 |
| 4. | 4 | 14. | 4 | 24. | 2 | 34. | 1 |
| 5. | 1 | 15. | 3 | 25. | 1 | 35. | 3 |
| 6. | 2 | 16. | 3 | 26. | 1 | 36. | 3 |
| 7. | 5 | 17. | 1 | 27. | 4 | 37. | 2 |
| 8. | 3 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 9. | 5 | 19. | 4 | 29. | 1 | 39. | 4 |
| 10. | 1 | 20. | 5 | 30. | 3 | 40. | 1 |

**චිත්‍ර කලාව I පත්‍රය**
**I කොටස 1 x 40 = 40**
**II කොටස 60 = 60 = 100**

I පත්‍රය සඳහා = ලකුණු 100
II පත්‍රය = ලකුණු 100
III පත්‍රය = ලකුණු 100 = 300/3

II - පත්‍රය සඳහා පිළිතුරු
'අ' කොටස - ලංකා කලා ඉතිහාසය

01. (i) ආසන ඝර චෛතිය ඝර බෝධි ඝර
පධාන ඝර උපෝසතා ඝර පඩිමා ඝර

(ii) * ස්ථූපයක ආරක්ෂාවට ඉදි වූ ගෘහ නිර්මාණ අංගය වටදාගෙය, වට්ඨධාතු ගෙය, චෛතිය ඝර, ථූප ඝර යන විවිධ නම් වලින් හඳුන්වයි.
* අතීතයේ දී මෙලෙස වටදාගෙවල් සාදන ලද්දේ ප්‍රමාණයෙන් තරමක් කුඩා ස්ථූප සඳහාය.
* ස්ථූපය කේන්ද්‍රකොට ගෙන ගල්කණු පේළි තුනක් හෝ හතරක් හිටුවා ඒ මත දැව භාවිතයෙන් පියස්සක් තනා වටදාගෙය නිමවන්නට ඇතැයි විශ්වාස කෙරේ.
* ලංකාවෙන් හමු වූ ඉහත ලක්ෂණ වලින් යුතු වටදාගෙවල් සඳහා උදාහරණ ලෙස ථූපාරාම වටදාගෙය, පොළොන්නරුව වටදාගෙය, මැදිරිගිරිය, වටවාගෙය, අම්බස්තල වටදාගෙය ආදිය දැක්විය හැක.

(iii) * චෛත්‍යයකආරක්ෂාවටත් අලංකාරයටත් සාදන ලද තොරණකට සමාන ගෘහ නිර්මාණ අංගය වාහල්කඩ ලෙස හඳුන්වයි.
* ඉන්දියාවේ සාංචි ස්ථූපයේ මීට සමාන නිර්මාණය වන්නේ සාංචි තොරණයි.
* ලංකා ස්ථූපවල වාහල්කඩ චෛත්‍ය සතර දිශාවේ හතරක් වේ.
* සෑම වාහල්කඩකම දෙපස ඇති කණු දෙකෙහි සත්ව රූප ඇත. දිශා 4 නිරූපණය සඳහා පැති හතරෙහි සත්ව රූප දක්නට ඇත. ඒ පහත සඳහන් පරිදිය.
උතුරු - සිංහයා, දකුණ - ගවයා, බටහිර - අශ්වයා , නැගෙනහිර - ඇතා
* තවද මෙම වාහල්කඩ පිළිබඳ විමසා බැලීමේදී මේවායේ මුදුනෙහි විමාණ තිබී ඇත. තවද මේ විමාන තුල දේවරූප තැම්පත් කර තිබී ඇත.
* නමුත් අද වන විට දැව, මැටි වැනි අමුද්‍රව්‍ය යොදා මේවායේ ඉහළ කොටස් නිමවීම නිසා, ඒවා විනාශයට ගොස් ඇත.
* අද වන විට ඉතිරිව ඇත්තේ ශෛලමය කොටස් පමණි.
* මෙහි ඇති කැටයම් පිළිබඳව විමසන විට කල්ප වෘක්ෂය වැදගත් කැටයමක් ලෙස දැක්විය හැක.
* මේ නිර්මාණයේ උඩුකුරු හා යටිකුරු පියුම් පෙති භාවිත කරමින් බොරදම් නිමවා ඇත. තවද සෑම පනේලයකම කැටයම් නිර්මාණය කර ඇත.
මේ ආකාරයට වාහල්කඩ පිළිබඳව විග්‍රහයක් කළ හැකිය.

02. (i) * මාර පරාජය , මහී කාන්තාව , ඇලි ඇතුන් දන්දීම, වෙස්සන්තර ජාතකය.

(ii) * දෙගල්දොරු විහාරයේ ඇලි ඇතුන් දන්දීම නම් සිතුවම පිළිබඳව විමසීමේදී මේ සිතුවම් මහනුවර යුගයට අයත් උඩරට සම්ප්‍රදායට අයත් සිතුවමකි.
* මෙම සිතුවමේ ඇතුන්ගේ ජංගමශීලී ස්වරූපය මැනවින් දක්වා ඇත.

* තවද අනුරාධපුර පොළොන්නරු චිත්‍ර කලාවේ දක්නට ලැබෙන බුද්ධිගෝචර බවින් මිදී අක්ෂිගෝචර බවක්ද දක්නට ලැබෙන තවත් සිතුවම් පෙළක් මින් හමුවේ.
* අඛණ්ඩ කථන ක්‍රමයට මනාව චිත්‍ර ගලායන ආකාරයෙන් ඇලි ඇතුන් දන්වීම චිත්‍රණය කර ඇත.
* මංගල හස්තිරාජා වෙසතුරු රජු පිටමත හිඳුවාගෙන ඇත් ගමනින් ඇවිද යන අයුරුත්, අනතුරුව කුඩා කල පටන් හැදී වැඩී ඇසුරු කළ ඇත් රජුගේ හොඬවැල අතින්ගෙන පැන් වත්කොට පවරාදෙන අයුරුත් මිනිසුන් අතර ඇති සබඳතාත්, ඒවායේ ඇති අනිත්‍ය බවත්, ප්‍රියයන්ගෙන් වෙන්වීම ආදී සංවේදී අවස්ථා මැනවින් නිර්මාණය කර ඇත.
* ලෞකික බැඳීම් වලින් මිදී තණ්හාවෙන් ආශාවෙන් මදී ලැබෙන මානසික සහනය දැක්වීමට ශිල්පියා සමත්ව ඇත.

(iii) දඹුලු විහාරයේ නිර්මාණ පිළිබඳව විමසා බැලීමේදී මූර්ති හා චිත්‍ර රසක් දක්නට ඇති බව පැහැදිලිය. මුලින්ම අප මෙහි මූර්ති පිළිබඳව විමසා බලමු.
* මෙයින් ද කන්ද උඩරට කලා සම්ප්‍රදායේ මහිමය කියාපයි. කළුගල් දැව හා හුණු බදාම වැනි මාධ්‍ය වලින් නිමවා ඇත.
* මෙම මූර්ති තුළින් දේවාතිදේව සංකල්පය මූර්තිමත් කරයි.
* මෙම පිළිම තුළ සාම්ප්‍රදායික මූර්ති කලාවේ ලක්ෂණ ජ්‍යාමිතික හැඩ භාවිතය හා සාම්ප්‍රදායික වර්ණ භාවිතය වැනි සුවිශේෂ ලක්ෂණ වේ.
* මෙහි බුදු පිළිම 48 දක්නට ඇති අතර ඉඳි පිළිම, හිටි පිළිම හා සැතපෙන පිළිම මේ අතර වේ.
* මෙම පිළිම විවිධ මුද්‍රා ප්‍රකට වන අයුරින් නිර්මාණය කර ඇත.
* මෙහි ඇති දිගින් අඩි 47ක් වන සැතපෙන පිළිමය ඉතා වැදගත්ය.
* මේ බුදු පිළිම වලට අමතරව විෂ්ණු සමන් නාථ පත්තිනි වැනි දේව රූපත්, වළගම්බා, නිශ්ශංකමල්ල වැනි රජුන්ගේ රූපත් නිර්මාණය කර ඇත.
* නුවර යුගයේ සිතුවම් අතර වැඩිම වියන් චිත්‍ර සමූහයක් හමුවන්නේ දඹුළු විහාරයේය.
* මෙම විහාරය ලෙන් පහකින් සමන්විත වේ.
* පුංචි අජන්තාව ලෙස ද මේ විහාරය හඳුන්වයි.
* විහාරයේ මැටි බිත්ති බහුලවීම නිසා ශිල්පීය, ගල් වියන්තලය අලංකාරව යොදාගෙන ඇත.
* මාතලේ නිලගම පරම්පරාව චිත්‍ර ඇඳීමට දායක වී ඇත.
* වියන්තලයේ ඉඩහසරප්‍රයෝජනයට ගනිමින් ඇඳි චිත්‍ර 2ක් ලෙස මාර පරාජය හා ප්‍රථම ධර්ම දේශනය දැක්විය හැක.
* තවත් වැදගත් චිත්‍ර ලෙස සූවිසි විවරණය දස බෝධිසත්වයන්, ලක්දිව සොළොස්මස්ථාන, විජයාවතරණය, දුටුගැමුණු එළාර යුද්ධය, සත්සතිය බුදු සසුන පිහිටුවීම වැනි චිත්‍ර දැක්විය හැක.
* එසේම වියන්තලයේ හිස් ඉඩකඩ ඇති අවකාශය පිරවීමට මල් ලියකම් හා රටා ජ්‍යාමිතික හැඩතල සහිත පුළුල් ව්‍යාප්ත වූ වියන්තල මෝස්තර දැක්වේ.
* මේ අනුව නුවර යුගයේ චිත්‍ර රසක් හමුවන කලාගාරයක් ලෙස මෙය හැඳින්විය හැක.
* පොදුවේ ගත්කළ මෙම චිත්‍ර තුළින් මහනුවර යුගයේ වර්ණ භාවිතය , රේඛාව භාවිතය අඛණ්ඩ කථන ක්‍රමය, සාම්ප්‍රදායක මල් වර්ග භාවිතය, බුදු පිළිම වටා රැස් වළල්ල ආදිය පිළිබඳ බලන විට මහනුවර යුගයේ ලක්ෂණ මැනවින් කැපී පෙනේ.

මේ ආකාරයට නිර්මාණය වූ චිත්‍ර හා මූර්ති මහනුවර යුගයේ කලා ලක්ෂණ වලින් යුක්ත බව පැවසිය හැක.

**ඉන්දියානු කලා ඉතිහාසය**

03. (i) * හුමායන්, අක්බාර්, සාජහාන්

(ii) * ලේනුන්ගෙන් පිරී හේනේ ගසඃ
මෙම නිර්මාණය ජෙහන්ගීර් රජ සමයේ නිර්මාණය කරන ලද්දකි.
* ස්වභාව දහමේ අසිරිය රාජධානිය තුළ චිත්‍රණය කරන ලෙස ශිල්පීන්ට ඇරයුම් කළපසු මෙම සිතුවම අබ්දුල් හසන්ගේ විසින් ජෙහාන්ගීර්ගේ මගපෙන්වීම තුළින් ඉතා චමත්කාරජනක ලෙස නිර්මාණය විය.
* මෙහි විවිධ චලන සහිත ඉරියව් සහිත ලේනුන්, මලින් පිරි තිබෙනු දක්නට ලැබේ.

(iii) මෝගල් හා රාජ්පුත් චිත්‍ර පිළිබඳව

| **මෝගල් චිත්‍ර** | **රාජ්පුත් චිත්‍ර** |
|---|---|
| * මෝගල් සිතුවම් වල ප්‍රභවය පර්සියාවයි. | * රාජ්පුතානා හා පන්ජාබී ප්‍රදේශ මුල්කරගෙන බිහිවිය. |
| * ඉස්ලාම් දහමෙන් බැහැර ලෞකික තේමා යොදා ගන්නා ලදී. | * මෙහි සම්ප්‍රදායන් 2කි. 1. රාජ්පුට් සම්ප්‍රදාය<br>2. පහාරි සම්ප්‍රදාය |
| * භාරතයේ ප්‍රථම අධිරාජයා හුමායන් | * හින්දු සාහිත්‍යයේ උපමා කථා මුල්විය. |
| * මොහු අක්බාර් වන තම පුතාටද, පර්සියා කලාවේ පුහුණුව දෙන ලදී. | * මහා භාරතය/භගවත් පුරාණය, රාමායනය, වැනි ග්‍රන්ථවල විවිධ අවස්ථා හා සිදුවීම් චිත්‍රයට නැගීය. |
| * චිත්‍ර කලාවට රාජ්‍ය අනුග්‍රහයද ලැබුණි. | * මිනිස් රූප තාත්විකව නොදක්වා සංකේතවත් කොට දක්වා ඇත. |
| | * ගංගා ඇලදොළ වැදගත් කොටගෙන ඇත. |
| * මෝගල් චිත්‍ර සඳහා තේමාව වූයේ රජ වාසල සිදුවීම් ය. | * රාජ්පුත් චිත්‍ර වලද සත්ව රූප වලට තැනක් දී ඇත. |

* ප්‍රභූ පිළිරූ චිත්‍ර ය.
* නමුත් අක්බාර්ගෙන් පසු රජ කිරුළ හිමි වූයේ ජොහන්ගීර් හටය. ඔහු ස්වභාව දහම චිත්‍රනයට නැඹුරු විය.
* මලින් පිරුණු ගස් පක්ෂීන් දුර්ලභ සනයේ සතුන්, කදු, පොකුණු වන ලැහැබ චිත්‍රයටනැගීය
* අබ්දුල් හසන්ගේ ලේනුන් පිරි ගස් ආදිය වැදගත්ය.
* ජන ජීවනය මුල්කරගත් චිත්‍රද විය.
ඉතා අලංකාරය.

* ගීත ගෝවින්දයේ රාධා හා ක්‍රිෂ්ණා ප්‍රේම වෘතාන්තය දක්විය හැක.
* තවද අලංකාර වර්ණ අර්ථවත්ව යොදාගෙන ඇත.
රතු - බිය, කහ - ආශ්චර්ය, දුඹුරු - ශෘංගාරය
* තවද රාග මාලා චිත්‍ර ද වේ.
* රාග මාලා චිත්‍රද වැදගත්ය.
* පුරුෂ රාග හයක් ස්ත්‍රී රාග 36ක්.
* ජනජීවිතය මුල්කරගත් චිත්‍ර ද විය.
* ඓතිහාසික ආගමික තේමා ද හේතු වී ඇති බව පෙනේ.

04. (i) * මොල්ලිය සහිත ගව රුව. * දිවියකු සමග සටන් කරන මිනිසා * වෘක්ෂ දෙවියා. * මාතෘත්තවය දක්වෙන මුද්‍රා. * අං සහිත දෙවියා.

(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පූජක රුව.
* මෙයින් යෝගාචාර වූ පූජකයෙකු නිරූපිතය.
* ශාන්ත ඉරියව්, අඩවන් දෙනෙත්, නාසය දෙසට යොමු වූ බැල්ම.
* දකුණු උරහිස නිරාවරණය වනසේ ඇඳි වස්ත්‍රය පොරෝණයක් ලෙස ඒකාංශ කොට පොරවා ඇත. ඉන් පූජකයෙකුගේ ලක්ෂණ ඉස්මතු වේ.
* මෙය පාකිස්ථාන කෞතුකාගාරයේ තැම්පත් කොට ඇත.
* සුදු හුණු ගලින් නිමවා ඇත. * මෙය 17.5 cm ය.
* මෙය තාත්වික නිරූපණයකට වඩා සංකේතාත්මක කල්පිත බවක් උසුලයි.
* මොංගෝලියානු ජාතිකයෙකුගේ අනුරුවක් පෙන්වයි.

(iii) * ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ගෘහ නිර්මාණ පිළිබඳව විමසීමේදී ඉතා උසස් ගෘහ නිර්මාණාත්මක ලක්ෂණ තිබූ බව නටඹුන් වලින් පැහැදිලිය.
* ප්‍රධානම සාධකය ලෙස පෙන්වා දිය හැක්කේ ප්‍රමාණ තුනක ගඩොල් භාවිතයයි.
* ගොඩනැගිලිවල බිත්ති පුළුල්ය. ඒවා තට්ටු දෙකකට ඔරොත්තු දෙන ලෙස නිමවා ඇත.
* ප්‍රභූවරුන්ගේ ගොඩනැගිලිවල බිත්ති ඔප මට්ටම් කර තිබී ඇත.
* නිවෙස්වල දොරටු මාර්ගයෙන් පිටතට විය. (සෞඛ්‍ය සම්පන්න බව)
* ගොඩනැගිලිවල ජනෙල් නොවීය. වා කවුළු විය.
* සමහර නිවෙස් වල මැද මිදුල්ද විය.
* නිවෙස්වල ජලය බැසයාමට අපවහන පද්ධතියක්ද විය.
* ගොඩනැගිලිවලට අදාල ධාන්‍යාගාර, මුළුතැන්ගෙවල් වැසිකිලි ද විය.
* සාමාන්‍ය නිවෙස්වල කාමර එකක් හෝ දෙකක් විය.
* සමහර කාමර පේළි කෙළවර ළිඳක් ද විය.
* කම්කරු නිවාසද වෙනස තනා ඇත.
* මීට අමතරව රජ මැදුර, ජල තටාක ද විය. ජල තටාකයට ජලය ගෙන ඒම හා ඉවත් කිරීම සඳහා ජල අපවහන පද්ධතියක් ද විය.
* ඒවගේම මොවුන් මියගිය පසු සියලු බඩුමුට්ටු සමග වල දමා ද ඇත.

05. (i) ජූලියස් සීසර්, කැරකාලා

(ii) ඔගස්ටස් සීසර්
මෙම මූර්තිය පහසුවෙන් හිටගෙන සිටින ඉරියව්වකින් නිර්මාණය කර ඇත. මෙයින් නිරූපණය වන්නේ ඔගස්ටස් සීසර් රෝමයේ අධිරාජයා වීමෙන් අනතුරුව ජනතාව අමතන ආකාරයයි. එක් අතකින් යෂ්ටියක් අත දරන අතර අනක් අත ඉහළට ඔසවා තරමක් ඇතට දෘෂ්ඨිය යොමා සිටී. සොල්දාදුවෙකු අඳින ලද ඇඳුම් කට්ටලයකින් සැරසී සිටී. ප්‍රතාපවත් පෙණුමක්, එඩිතර විලාසයක් පිළිබිඹු වේ හැඟීම් ප්‍රකාශනය විශිෂ්ඨය. මූර්තිය පසෙකින් කුඩා මූර්තියක්ද වේ. මෙය දැනට වතිකන් කෞතුගාගාරයේ තැන්පත් කර ඇත.

(iii) රෝම ගෘහ නිර්මාණ කලාවේ අභිමානවත් නිර්මාණයක් ලෙස කොලෝසියම් රඟහල, වියග්‍රහණ ආරුක්කු සහ කුළුණු හැඳින්විය හැක.

**<u>කොලෝසියම් රඟහල</u>**

නටඹුන්ව ඇති ෆ්ලේවියන් ඇම්පිතියටර් නමින් හැඳින්වෙන කොලෝසියම් රංගපීඨය රෝමයේ අභිමානවත් වාස්තු විද්‍යා නිර්මාණයකි.
ඕවලාකාර හැයෙන් යුතු මහල් සහිත ගොඩනැගිල්ල මධ්‍යයේ රංගපීඨය ඉදිවිය. මෙය ඇරීනා නමින්ද හැඳින්වෙයි. අධිරාජයන් සහ වංශාධිපතියන් වෘත්තාකාර ප්‍රේක්ෂක මණ්ඩපය තුළ හිඳ මේ තුළ ප්‍රදර්ශනය වූ බිහිසුනු සටන් නරඹන ලදී.

**විජයග්‍රහණ ආරුක්කු :**

* ටයිටස් ආරුක්කුව * සෙප්ටිමස් ආරුක්කුව * කොන්ස්ටන්ටයින් ආරුක්කුව

මෙම ආරුක්කු මුදුනේ අධිරාජයාගේ පිළිරූ නිර්මාණය කළ අතර, යුද බිමෙහි සිදු වූ සටන් පිළිබඳ දර්ශන ඇතුළත් සිද්ධීන් ආරුක්කු මත කැටයම් කර ඇත. අධිරාජයාගේ යුද ජයග්‍රහණ සිහිවීම සඳහා ඉදිකර ඇති මෙම ආරුක්කුව යටින් මාර්ගය පිහිටා ඇත. මධ්‍යයේ ඇති විශාල කවුළුව යටින් මහා මාර්ගයද, දෙපස ඇති කුඩා කවුළු දෙක යටින් කුඩා මාර්ග දෙකක්ද ඉදිකර ඇත.

**විජයග්‍රහණ කුළුණු :**

රෝමවරු යුද ජයග්‍රහණ සිහිවීම පිණිස ආරුක්කු වලට අමතරව විශාල ස්ථම්භ ඉදිකරන ලදී. මෙ ස්ථම්භයක උස අඩි 100 ක් පමණ වේ. කුළුණ මුදුනේ අධිරාජයාගේ ප්‍රතිමාව ඉදි වූ අතර පහළ සිට ඉහළට විහිදී යන ආකාරයට සර්පිලාකාරව සියුම් කැටයම් ඇතුළත් දර්ශන 154 පමණ ප්‍රමාණයක් රූපාවලියක් ලෙස දක්නට ලැබේ. මෙම කැටයම් වලට පාදක වී ඇත්තේ යුද ජයග්‍රහණය පහත සඳහන් කුළුණු එයට නිදසුන්ය.
මාකස් ඔරුලියස් කුළුණ, ට්‍රජන් කුළුණ


06. (i) * ස්පින්ක්ස් * රමෙසස් * කාෆ්රේ * මෙන්කවුරේ * නෙපර්ටිටි
* රනෝටෙප් සහ නෝෆ්‍රෙට් * ඇමෝන් හිරු දෙවියන් * රණොෆා * ස්ක්‍රයිබ්
* අක්නේටන් සහ නෙපර්ටිටි

(ii) මිසර ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨ නිර්මාණයක් ලෙස අබුසිම්බල් දේවස්ථානය හැඳින්විය හැක.
මෙය දෙවන රමේසස් රජුගේ දේවස්ථානය ලෙස සැලකේ. නයිල් ගංගා නිම්නයේ සුවිසල් ගල් පර්වතයක මුහුණතේ ඇතුළට හාර නිමකර ඇත. අස්වාන් වේල්ල ඉදිකිරීම නිසා මෙම දෙවොල කපා ඉවත් කොට උස් බිමක පිහිටුවා ඇත. මෙම දෙවොල පහත සඳහන් විශේෂතා වලින් සමන්විතය.
* උසින් අඩි 80 ක් සහ පළලින් අඩි 124 ක්.
* දොරටුව දෙපස අඩි 60 පමණ උස පාරා රූ සතර දෙඅත් උකුල මත තබාගෙන ඉඳගෙන සිටින මෙම රූ යුගල වශයෙන් ඇත.
* ඇතුළට පිවිසෙන අන්තරාලය දෙපස ඔසිරිස් දෙවියන් ලෙස හැඳින්වෙන අඩි 30 ක් පමණ උස රමේසන් පිළිරූ එක් පසෙක 4 බැගින් 8ක් තිබේ.
* දෙවොල අභ්‍යන්තරයේ දෙවියන් සිව් දෙනෙකුගේ ප්‍රතිමා තිබීම. ඉන් එකක් රමේසන් රජුගේ වීම.

(iii) කුරුළු දඩයම නැමති මිසර සිතුවම මධ්‍යම රාජධානි යුගයට අයත්ය.
* මෙය ඉටේට් වංශාධිපතිවරුන්ගේ සොහොන් ගැබෙහි දක්නට ඇත.
* සාම්ප්‍රදායික ලක්ෂණ හා ස්වභාවික ලක්ෂණ අතර සම්මිශ්‍රණයකි.
* වංශාධිපතියා හා ඔහුගේ බිරිඳ දියණිය යැයි සිතිය හැකි මානව රූප සාම්ප්‍රදායික ලෙස පාර්ශවීය හා පූර්වාදර්ශන රීති අනුගමනය කරමින් ඇඳ ඇත.
* වංශාධිපතියා ඔරුවක නැගී කුරුල්ලන් දඩයම් කිරීමෙහි යෙදෙන අවස්ථාවක් නිරූපිතය.
* මෙහි සත්ව රූප ස්වාභාවික ලෙස ඇඳ ඇත.
* වංශාධිපතියා අතෙහි භුමරංගය නැමැති ආයුධයක් සහ දකුණතෙහි ඉගිලෙන කුරුල්ලන් තිදෙනෙක් දරා සිටී.
* දඩයම් බළලෙක් උගේ පාවලින් පක්ෂීන් දෙනෙකුද කටින් තවත් පක්ෂියෙකුද අල්ලාගෙන සිටී.
* පැපිරස් පඳුරු රටාවකට සිතුවම් කර ඇත.
* ජලයේ පිහිනන මාළුද තාත්වික ලෙස නිරූපණය කෙරේ.
* සිතුවම සඳහා අඳුරු කහ, ගුරු, රතු, සුදු, කළු යන වර්ණ භාවිත කොට ඇත.
* චිත්‍රය පසුබිමේ රූපාක්ෂර දැකිය හැක.
* වංශාධිපතියා අතේ සිටින කුරුල්ලන් තිදෙනාගේ පර්යාවලෝක සද්ධාන්තදැකිය හැකි වුවත් සමස්ත චිත්‍රයේ එය දැකිය නොහැක.
* සත්ව රූප මද වශයෙන් ත්‍රිමාණ ලෙස වර්ණකර ඇත.

**තෙවන වාර පරීක්ෂණය - 2018 - 13 ශ්‍රේණිය**

**චිත්‍ර කලාව II - ආදර්ශ චිත්‍රය පිළිතුරු පත්‍රය**



## තෙවන වාර පරීක්ෂණය - 2018 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව II - ලකුණු දීමේ නිර්ණායක
## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

අභිමාතාර්ථ

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තුන් ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණා භාවිතාය පිළිබඳ හැකියාව මැන බැලීම

II වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයන් ද්‍රව්‍ය සමූහය ඇසුරින් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු තීරණය කල යුතුවේ. එකිනෙක නිර්ණායකන් යටතේ තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීමෙ කල යුතුවේ.

ලකුණු දීමේ නිර්ණායක :-

01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරීමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාන්තලෝකය,ත්‍රිමාණ ලක්‍ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) (ල. 20)
04. වර්ණ භාවිතය හා ගති ලක්‍ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

---

## තෙවන වාර පරීක්ෂණය - 2018 - 13 ශ්‍රේණිය
## චිත්‍ර කලාව III - ලකුණු දීමේ නිර්ණායක
## "අ" කොටස - චිත්‍ර සංරචනය

ලකුණු දීමේ පටිපාටිය:-

### III - පත්‍රය 'අ' චිත්‍ර සම්පිණ්ඩනය

1. තොරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව (ලකුණු 20)
2. රේඛා හැඩතල ඇසුරින් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව(ලකුණු 20)
3. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය (ලකුණු 20)
4. වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව (ලකුණු 20)
5. අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ආ' මෝස්තර හා සැරසිලි නිර්මාණය

1. මාතෘකාවට අදාල නිර්මාණ කාර්යයට උචිත අයුරින් (ලකුණු 20)
2. පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව හා කර්මාන්තයට (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව (ලකුණු 20)
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

### III - පත්‍රය 'ඉ' ග්‍රැෆික් නිර්මාණය

1. මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව (ලකුණු 20)
2. වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව. (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව (ලකුණු 20)
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)